## අධ්‍යාපනපති සාමාන්‍ය (පූර්ණකාලීන) පාඨමාලාව Master of Education in General (Full Time) Course – 2020/2021 (සිංහල මාධ්‍යය)

## අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ අධ්‍යාපනපති (පූර්ණකාලීන) පාඨමාලාව Master of Education in Educational Management (Full Time) Course – 2020/2021 (සිංහල මාධ්‍යය)

## අධ්‍යාපනික හා සංවර්ධන මනෝවිද්‍යාව පිළිබඳ අධ්‍යාපනපති (පූර්ණකාලීන) පාඨමාලාව Master of Education in Educational and Development Psychology (Full Time) Course – 2020/2021 (සිංහල මාධ්‍යය)

## විද්‍යා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනපති (පූර්ණකාලීන) පාඨමාලාව Master of Education in Science Education (Full Time) Course – 2020/2021 (සිංහල මාධ්‍යය)

### අධ්‍යාපන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

---

**හැඳින්වීම**

කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨය මගින් පවත්වනු ලබන ඉහත අධ්‍යාපනපති පාඨමාලා අධ්‍යාපන ක්ෂේත්‍රයට සම්බන්ධ ගුරුවරුන් / විෂයමාලා සම්පාදකයින් / පරිපාලකයින් / කළමනාකරුවන් ගේ විශේෂඥතාව උදෙසා සැකසුන පාඨමාලා වේ. මෙම පාඨමාලා හැදෑරීමට තෝරාගැනීම සඳහා රජයේ හෝ පෞද්ගලික අධ්‍යාපන ක්ෂේත්‍රයේ සේවයේ නියුතු අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පූර්ණකාලීන පාඨමාලා නිසා නිවාඩු හිමිකම් ඇති අය පමණක් අයදුම් කළයුතු වේ.

**පාඨමාලාවේ අරමුණු**

1. අධ්‍යාපනයේ විවිධ ක්ෂේත්‍ර පිළිබඳ විශේෂඥතාව ඇති කිරීම.
2. අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවතින විවිධ ගැටලු විසඳීමෙහිලා පර්යේෂණ කාර්යයෙහි නිරත වීමට අවශ්‍ය දැනුම කුසලතා හා ආකල්ප සංවර්ධනය කිරීම.
3. ශාස්ත්‍රීය රචනය උදෙසා ප්‍රවීණතා ඇතිකිරීම.
4. අධ්‍යාපන ක්ෂේත්‍රයේ උසස් සේවා සඳහා අත්‍යවශ්‍ය දැනුම කුසලතා හා ආකල්ප සංවර්ධනය කිරීම.

**පාඨමාලා කාලය**

මෙම පාඨමාලාව එක් අවුරුදු පූර්ණ කාලීන පාඨමාලාවකි. සතියේ දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා පැවැත්වේ. 80% ක පැමිණීම අනිවාර්ය වේ. පූර්ණ කාලීන අධ්‍යයන නිවාඩු ලබා ගැනීම ඔබගේ වගකීමකි.
පාඨමාලාව පැවැත්වෙන භාෂා මාධ්‍යය : මෙම පාඨමාලා සිංහල මාධ්‍යයෙන් පැවැත්වෙයි. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ හැකියාව වැදගත්වේ.

**පාඨමාලාවට ඇතුළුවීමට සුදුසුකම්**

| | |
|---|---|
| **ප්‍රවේශ සුදුසුකම්** | කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනවේදී විශේෂ උපාධිය / කොළඹ විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව / පිළිගත් විශ්වවිද්‍යාලයක පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව සම්පූර්ණ කර ඇති අයගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. |
| **පළමුවන වර්ගය :-** | කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනවේදී විශේෂ (පළමුවනපෙළ / දෙවනපෙළ) උපාධි සහතිකය හෝ පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සහිතව කොළඹ විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව විශිෂ්ඨ හෝ සම්මාන සාමාර්ථයක් සහිතව සමත් වීම.<br>හෝ<br>වෙනත් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඒ හා සමාන සුදුසුකම් සපුරා තිබීම. |

**දෙවන වර්ගය :-** කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනවේදී විශේෂ උපාධි පරීක්ෂණය සමත් වී තිබීම.

හෝ

පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිය සමත්ව, කොළඹ විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා විභාගය සමත් වී තිබීම.

- ඉහත සුදුසුකම් ඇතුළත්ව අයදුම්පත් කැඳවන අවසාන දිනට වසර තුනක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

**පාඨමාලා ගාස්තුව :-** රු. 90,000/- කි.
මීට අමතරව පුස්තකාල භාවිතය සඳහා ආපසු ගෙවනු ලබන රු.5000/- ක් තැන්පත් කළ යුතුය.

පාඨමාලා ගාස්තුව පාඨමාලාව ආරම්භයේදී එකවර ගෙවා පාඨමාලාව සඳහා ලියාපදිංචි විය යුතුය. පාඨමාලා ගාස්තු ගෙවූ පසු, නැවත අයදුම්කරු වෙත ආපසු එම මුදල් නොගෙවනු ඇත.

පාඨමාලාව සඳහා බඳවාගැනීමට අපේක්ෂිත ශිෂ්‍ය සංඛ්‍යාවට වඩා වැඩි අයදුම්පත් සංඛ්‍යාවක් ලැබී ඇතිවිට, තෝරා ගැනීමේ විභාගයක් සහ සම්මුඛ පරීක්ෂණයක් පවත්වා, ඉහළම ලකුණු ලබන අයදුම්කරුවන් පමණක් තෝරාගනු ලැබේ.

**පාඨමාලාවට අදාළ තොරතුරු විමසීම්**

පාඨමාලාවට අදාළ තොරතුරු,
කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ වෙබ් අඩවිය පිරික්සීමෙන් ලබාගත හැකිය. (http://edu.cmb.ac.lk)
නැතහොත්,
011-2588812 දුරකථන අංකය ඇමතීමෙන් ලබාගත හැකිය.

**පාඨමාලාව සඳහා අයදුම් කරන ආකාරය**

කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ වෙබ් අඩවියෙන් ලබා ගත් අයදුම්පත්, පහත සඳහන් අදාල පාඨමාලාවේ මහජන බැංකුවේ කොළඹ විශ්වවිද්‍යාලයේ ගිණුම් අංකයට රු.1000/- ක මුදලක් ගෙවනු ලැබූ බැංකු වව්චරය (නිල මුද්‍රාව සහිතව) සමඟ නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය පහත සඳහන් ලිපිනයට ලියාපදංචි තැපෑලෙන් එවීම හෝ පැමිණ භාරදිය හැකිය. (වව්චරයේ පිටපතක් තමා ළඟ තබා ගැනීම වැදගත් වනු ඇත.)

සැ.යු. - **අයදුම්පත සම්පූර්ණ කිරීමේදී ඉතා පැහැදිලිව ඔබ අයදුම් කරන්නේ පූර්ණ කාලීන පාඨමාලාවට ද අර්ධ කාලීන පාඨමාලාවට ද යන්නත් එය යටතේ කවර අධ්‍යාපනපති පාඨමාලාව ද යන්නත් සඳහන් කළ යුතුය. එසේම ඔබට අයදුම් කළ හැක්කේ උපරිම පාඨමාලා දෙකකට පමණි. ඒ සඳහා වෙන වෙනම මුදල් ගෙවා අයදුම්පත් දෙකක් ඉදිරිපත් කළ යුතුය.**

- Master of Education in General Course – 2020/2021 (Sinhala Medium) - **Account No. 206147100003**
- Master of Education in Educational and Development Psychology Course - 2020/2021 (Sinhala Medium) - **Account No. 206177500006**
- Master of Education in Educational Management Course - 2020/2021 (Sinhala Medium) - **Account No. 206177600005**
- Master of Education in Science Education Course - 2020/2021 (Sinhala Medium) - **Account No. 206207700017**

**අයදුම්පත් බාර ගැනීමේ අවසාන දිනය**

2020 ජුනි මස 20 වන දින හෝ ඊට පෙර නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය (රු. 40 සහ රු. 15 ක වටිනාකමින් යුත් සෙ.මී. 22 x 10 ප්‍රමාණයේ තම පෞද්ගලික ලිපිනය ලියූ ලියුම් කවර දෙකක් සහිතව) පහත සඳහන් ලිපිනයට අතින් හෝ ලියාපදංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරනු ලබන පාඨමාලාව සඳහන් කරන්න.

උදා:- ''MEd/G/FT'' හෝ "MEd/Psy./FT'' හෝ "MEd/Mgt./FT'' හෝ "MEd/Sc./FT''

- Master of Education in General (Full Time) Course (MEd/G/FT)
- Master of Education in Educational and Development Psychology (Full Time) Course (MEd/Psy./FT)
- Master of Education in Educational Management (Full Time) Course (MEd/Mgt./FT)
- Master of Education in Science Educational (Full Time) Course ('MEd/Sc. Edu./FT')

උදා.

> පාඨමාලා සම්බන්ධීකාරක
> අධ්‍යාපනපති (පූර්ණ කාලීන) පාඨමාලාව
> අධ්‍යාපන පීඨය
> කොළඹ විශ්වවිද්‍යාලය
> කොළඹ 03

**පාඨමාලා ආරම්භ කිරීම (2020/2021 පාඨමාලාව)**

තෝරාගැනීමේ විභාගය සහ සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය කොළඹ විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවියෙහි පලකරන අතර (http://edu.cmb.ac.lk) ඊට අමතරව අයදුම්කරුවන් වෙත තැපැල් මඟින් ද දන්වනු ලැබේ.